# මාලිමාව

පාර්ලිමේන්තු මැතිවරණය
2020 අගෝස්තු 05
විශේෂ මැතිවරණ කලාපය




## තිත්ත දේශපාලනයේ

# ඇත්ත මිනිස්සු දිනවමු

අගෝස්තු මස 05වන දිනට යෙදී තිබෙන පාර්ලිමේන්තු මහමැතිවරණයේදී අලුත් තීරණයක් ගන්නා ලෙසත්, වසර 72ක් තිස්සේ රට අගාධයෙන් අගාධයට ගෙනගිය අදූරදර්ශී දේශපාලනයට එරෙහිව ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපත්තිගරුක දේශපාලන වැඩපිළිවෙළ සමග එක්වන ලෙස ජාතික ජන බලවේගය ජනතාවගෙන් ඉල්ලා සිටී.

පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ බොහෝ මැති ඇමතිවරුන්ගේ හැසිරීම හා ක්‍රියාකලාපයන් නිසා බොහෝ දෙනාට දේශපාලනය අප්‍රසන්නව, තිත්ත වී තිබේ. සැබවින්ම අද අප මුහුණපා සිටින බරපතළ ආර්ථික, සමාජයීය, දේශපාලන අර්බුද සියල්ලකට ම පාහේ වගකිව යුත්තේ යල්පිනූ දේශපාලනය බව අවිවාදිත ය. ඒ නිසාම මේ ව්‍යසනකාරී තට්ටුමාරු පාලන ක්‍රමයෙන් අප රට මුදාගත යුතුව තිබේ.

සැබෑ ලෙසම ජනතාව වෙනුවෙන් කැපවන, වගකීම් සම්පන්න, උගත්, බුද්ධිමත්, ක්‍රියාශීලී හා අවංක අපේක්ෂක අපේක්ෂිකාවන් ජාතික ජන බලවේගයෙන් ඉදිරිපත්ව සිටින අතර, මීළඟ පාර්ලිමේන්තුව සඳහා ඔවුන් තෝරා පත්කර රටේ ගමන් මග නව මාවතකට යොමු කිරීමට දායක වන ලෙස පුරවැසියන්ගෙන් ජාතික ජන බලවේගය ඉල්ලා සිටී.




**රටට මග කියන මාලිමාව දිනවමු..!**

# පාර්ලිමේන්තු මැතිවරණය 2020
## ජාතික ජන බලවේගයේ ජාතික ලැයිස්තු කණ්ඩායම



**01. බිමල් රත්නායක මහතා**
(ජ.වි.පෙ. ජාතික සංවිධායක, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී)



**02. මහාචාර්ය චන්ද්‍රන අබේරත්න මහතා**
(කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති, ජාතික විද්වත් සංවිධානයේ සභාපති, ජාතිය ගොඩනැගීමේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**03. ජිනදාස කිතුලගොඩ මහතා**
(ජ.වි.පෙ මධ්‍යමකාරක සභික, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී)



**04. ජ්‍යෙෂ්ඨ නීතිඥ ලාල් විජේනායක මහතා**
(එක්සත් වාමාංශික පෙරමුණේ ලේකම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ සභාපති)



**05. ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය**
(ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජිකා, ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුවේ සාමාජිකා)



**06. ජ්‍යෙෂ්ඨ නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතා**
(පළාත් පාලන සීමා නිර්ණ අභියාචනා කමිටුවේ හිටපු සාමාජික, ජාතිය ගොඩනැගීමේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**07. හිටපු අමාත්‍යාංශ ලේකම් අශෝක පීරිස් මහතා**
(පළාත් පාලන සීමා නිර්ණ අභියාචනා කමිටුවේ හිටපු සභාපති, ජාතිය ගොඩනැගීමේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**08. හිටපු අමාත්‍යාංශ ලේකම් ප්‍රේමලාල් අබේසිංහ ගුණසේකර මහතා**
(ප්‍රවීණ ලේඛක, ජාතිය ගොඩනැගීමේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**09. ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා**
(ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වරලත් ගණකාධිකාරී, ආර්ථික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සභාපති)



**10. මහාචාර්ය කුමාර් ඩේවිඩ් මහතා**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ හොංකොං විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය)



**11. මහාචාර්ය විජය කුමාර් මහතා**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ විශ්‍රාමික මහාචාර්ය)



**12. ආචාර්ය මයිකල් ප්‍රනාන්දු මහතා**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොමියුනිස්ට් පක්ෂයේ විකල්ප කණ්ඩායමේ සාමාජික)



**13. සාහිත්‍යවේදී ජයතිලක කම්මැල්ලවීර මහතා**
(රාජ්‍ය සම්මානලාභී ලේඛක, කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)



**14. සංගීතඥ නදීක ගුරුගේ මහතා**
(ප්‍රවීණ සංගීතවේදී, කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)



**15. සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ මහතා**
(රාජ්‍ය සම්මානලාභී ලේඛක, කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)



**16. ඉංජිනේරු කුමාර ජයකොඩි මහතා**
(ජාතික විද්වත් සංවිධානයේ ජාතික කමිටු සාමාජික)



**17. විශේෂඥ වෛද්‍ය මොහමඩ් රිස්වි සාලි මහතා**



**18. සාම විනිසුරු සෙල්ලයියා සිවලෝගනාදන් මහතා**
(කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාමික ප්‍රධාන ග්‍රාම නිලධාරී, සමාජ ක්‍රියාකාරී)



**19. ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(සබරගමුව විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)



**20. විශේෂඥ වෛද්‍ය මහාචාර්ය ක්‍රිශාන්ත අබේසේන මහතා**
(කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහජන සෞඛ්‍ය පිළිබඳ මහාචාර්ය, ප්‍රජා වෛද්‍ය විශේෂඥ, සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සභාපති)



**21. මහාචාර්ය ජිනසේන හේවගේ මහතා**
(රුහුණ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ මහාචාර්ය, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**22. මහාචාර්ය ප්‍රේමදාස ජයකොඩි මහතා**
(කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා මහාචාර්ය, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික)



**23. මොහොමඩ් මුලාෆර් මොහොමඩ් මුනීර් මහතා**
(සිවිල් සමාජ ක්‍රියාකාරී)



**24. මහාචාර්ය සුසිරිපාල මානවඩු මහතා**
(රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ විශ්‍රාමික මහාචාර්ය)



**25. සමාජ ක්‍රියාකාරිනී චමිලා තුෂාරි මහත්මිය**
(ඩාබිඳු සාමූහිකයේ වැඩසටහන් සම්බන්ධීකාරක)



**26. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී අනුර හෙට්ටිගොඩ මහතා**
(එතෙර අපි සංවිධානයේ දෝහා කටාර් ශාඛාවේ උපදේශක, දෝහා කටාර් පෙට්‍රෝලියම් සමාගමේ ප්‍රධාන ගණකාධිකාරී)



**27. ප්‍රවීන රංගන ශිල්පිනී දීපානී සිල්වා**
(කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)



**28. නීතිඥ තුවාන් කේ. අසූර් මහතා**
(ශ්‍රී ලංකා මැලේ සංගමයේ සභාපති)



**29. ප්‍රවීන රංගන ශිල්පී ජගත් මනුවර්ණ**
(කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික, අලුත් පරපුර සංවිධානයේ සහ ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාමාජික)

# අපි කවුද? මොනවද කරන්නෙ?

ජාතික ජන බලවේගය යනු හුදෙක් මැතිවරණයට ඉදිරිපත්වීම සඳහා ඇතිකරගත් දේශපාලන සන්ධානයක් නොවේ. එය උසස් සංස්කෘතික මිනිසකු සහිත සමාජයක් ඇතිකරලීම අරමුණ කරගත් විවිධ දේශපාලන පක්ෂ සිවිල් සංවිධාන හා පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සමාජ සංවිධානයකි.

ජාතික ජන බලවේගය ශ්‍රී ලාංකේය රාජ්‍යය තුළ ආර්ථික ස්වාධීනත්වය හා සාධාරණත්වය සහිත නොසැලෙන ස්ථායි ආර්ථිකයක් ඇතිකරලීම වෙනුවෙන් පෙනී සිටී. එය ආචාරධාර්මික පුරවැසියකු ඇතිකරලීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ද, සංතෘප්තිමත් සමාජයක නිරෝගිමත් මිනිසකු ඇතිකරන සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ද, ඒ සඳහා මානවීය කලා හා සංස්කෘතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතු බව විශ්වාස කරයි.

එය පිවිතුරු සුන්දර පරිසරයක් ලැබීමට සියලු මිනිසුන්ට ඇති අයිතිය පිළිගනී. නවීන තාක්ෂණය බද්ධ කරගනිමින් සුහදශීලී, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇතිවියයුතු බව විශ්වාස කරයි. එසේම සියලු ප්‍රජාවන් සමාන ලෙස සලකන නීතිය සහ ප්‍රජාතන්ත්‍රවාදය රකින, ව්‍යවස්ථාවට ගරු කරන, සියලු ප්‍රජාවගේ පැවැත්ම පිළිගනිමින් ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරන, විශේෂ අවධානයට ලක්විය යුතු කණ්ඩායම්වල අයිතීන් හා වගකීම් ඉහළින්ම පිළිගෙන ඒවා සුරකින සමාජයක් ආචාරධාර්මික ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අපේක්ෂා කරයි.


එසේම ජාතික ජන බලවේගය නියෝජනය කරන අපි, ප්‍රගතිශීලි, වාමාංශික, ප්‍රජාතන්ත්‍රවාදී, ජාතික සමගිය වෙනුවෙන් වසර ගණනාවක් තිස්සේ පෙනී සිටි, විශ්වසනීය දේශපාලන භාවිතාවක් සහ අත්දැකීම් ඇති දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන හා විවිධ වෘත්තීන් නියෝජනය කරමින් ඉහත ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සක්‍රියව සහභාගී වුණු, ජනතාව වෙනුවෙන් විවිධ අවස්ථාවලදී නොබියව පෙනී සිටි වෘත්තිකයින් හා සමාජ කණ්ඩායම්වලින් සැදුම්ලත් සමාජ ව්‍යාපාරයක් වෙමු.

ජාතික ජන බලවේගය අප රටෙහි වාසය කරන සෑම ජනකොටසක්ම නියෝජනය කරයි. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින්, ජනතාව වෙනුවෙන් අරගල කිරීමේ අත්දැකීම් ඇති වෘත්තීය සමිති නායකයන්, වෘත්තිකයන්, මාධ්‍යවේදීන්, කලාකරුවන්, ගුරුවරුන්, පරිසරවේදීන්, කාන්තා සහ තරුණ ඇතුළු සියලු සමාජ කොටස් නියෝජනය වේ.

එසේම වසර ගණනාවක් තිස්සේ සක්‍රිය මහජන නියෝජිතයන් ලෙස කටයුතු කර ඇති ජාතික ජන බලවේග යේ කිසිවකුට; දූෂණ, වංචා, අපචාර, ස්ත්‍රී/ළමා දූෂණ, චෝදනා නැත. ඔවුන් දේශපාලනය තම ජීවනෝපාය මාර්ගය නොව, තම වගකීම ලෙස දකිති. සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාවය තම දේශපාලන මතවාදයේ සහ භාවිතයේ ප්‍රධාන වටිනාකම් ලෙස පිළිගනිති.

**ජාතික ජන බලවේගය ශ්‍රී ලාංකීය රාජ්‍යය තුළ ආර්ථික ස්වාධීනත්වය හා සාධාරණත්වය සහිත නොසැලෙන ස්ථායි ආර්ථිකයක් ඇතිකරලීම වෙනුවෙන් පෙනී සිටී. එය ආචාරධාර්මික පුරවැසියකු ඇතිකරලීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ද, සංතෘප්තිමත් සමාජයක නිරෝගිමත් මිනිසකු ඇතිකරන සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ද, ඒ සඳහා මානවීය කලා හා සංස්කෘතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතු බව විශ්වාස කරයි.**

පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු කටයුතු කරනුයේ ඉහත කී උසස් අරමුණ ඉටු කරගැනීමට සහ මහජන අයිතීන් ආරක්ෂාකර ගැනීමටය. මෙම සියලු හේතූන් නිසා ජනතාව වෙනුවෙන් සටන් කළ හැකි, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන, රටට අවශ්‍ය, ජනතාවාදී ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කරන, දූෂණයට එරෙහි වන, ජනතාවට වගවන, පාර්ලිමේන්තුවක් නිර්මාණය කරගත හැක්කේ ජාතික ජන බලවේගයේ අපේක්ෂකයින් සිය මහජන නියෝජිතයන් ලෙස තෝරා පත්කර ගැනීමෙන් පමණි●



## ධවල වස්ත්‍ර වෛර සංදේශය

ඔබ දන්නවද මං මේ මොන පැත්තට ද ඉගිල්ලෙන්නෙ කියල. මම යන්නෙ ලෝයර් මහත්තයෙක් හම්බවෙලා උපදෙස් ටිකක් ගන්න. කෙලින්ම කියන්නම්කො.. මට ඕනේ මගේ නම වෙනස් කරගන්න. නිකමට හිතල බලන්නකෝ. මගේ සහෝදර කුරුල්ලන්ට ලස්සන ලස්සන නම් තියෙනකොට, මට විතරක් සුදුරෙදි හොරා කියල කියද්දී ටිකක් අවුල් වගේ නේද ? ලස්සන කැත කියන්නෙ එක එක්කෙනාට එක එක විදිහට පේන දෙයක් තමයි. ඒත් මගේ නමේ පුංචි ලස්සනක්වත් නෑනේ මේ හොරා කියන කෑල්ල නිසා. කවුද කැමති නමේ අගට හොරා කියල එනවට. කවුරුත් කැමති නැහැනේ.

මාත් ආසාවෙන් හිටියේ සැළලිහිණි, මයුර, හංස, ගිරා වගේ මගේ නමින් සංදේශ කාව්‍යයක් ලියවෙනවට. ඒත් ඉතින් එහෙම ලියවෙන සංදේශයට සුදුරෙදි හොර සංදේශය කියන්නයැ. අපේ පණ්ඩිත කුරුල්ලෙක් එක පාරක් කිව්වා, ධවල වස්ත්‍ර වෛර සංදේශය කියල මගේ නමින් සන්දේශයක් ලියවන්නය කියලා. කොච්චර බර වචන දැම්මත් හොරා හොරාමනේ කියල මම කිව්වා. දැන් ඕගොල්ලො කල්පනා කරනවා ඇති, අවුරුදු සිය ගාණක් තිබ්බ නමක් මොකද මේ එක පාරට වෙනස් කරන්නෙ මේ ලස්සන සුදු පාට පෙඳේ දැකපු මිනිස්සු ආදරේට දාපු නමක්නෙ කියල. ඒක ඇත්ත තමයි. මටත් ඒක නොතේරෙනව නෙමෙයි. ඒත් එක්තරා සිද්ධියක් හින්දා මට මගේ නම ගැන ලැජ්ජා හිතුණා.

එක දවසක් මම කොහේ හරි ගිහින් එන ගමන් මහන්සි නිවාගන්න කියල ගහක අත්තක් උඩ වාඩි වුණා. එතන ඉඳන් බැලුවම පල්ලෙහා පිට්ටනියේ මොකක්දෝ රැස්වීමක් තිබ්බා. සුදු පාට අත්දිග කමිසෙකුයි සුදු සරමකුයි ඇඳපු ලොක්කෙක් කතාවක් පවත්වනවා. මිනිස්සු විසිල් ගහනව. අප්පුඩි ගහනව. අර මනුස්සයා මාර සුරංගනා කතා ටිකක් කිව්වා. මිනිස්සු අතර ඔය ඡන්දද මොනවද කියල ජාතියක් තියෙනවලුනෙ තමන්ගෙ නියෝජිතයො තෝරන්න. අන්න ඒ රැස්වීමක තමයි අර සුරංග නා කතා ටික කිව්වේ. මටත් ඉතින් පොඩි කාලෙ ඉඳල ඕව ඇහිලා තියෙනව. අපේ තාත්තල සීයලත් ඇහුවා. අර ලොක්කෝ කියන්නේ සුරංගනා කතා කියල අපිට තේරුණාට මිනිස්සුන්ට තේරෙන්නෙ නැත්තෙ ඇයි කියල මට තාමත් තේරෙන්නෙ නෑ.

ඉතින් කොහොමහරි එදා අර රැස්වීම ඉවරවෙලා අර සුදු අන්දපු ලොක්කා තමන්ගෙ පිරිවරත් එක්ක පිටත් වුණා. එයා ගියාට පස්සෙ එතන කඩේක හිටපු මනුස්සයෙක් කිව්වා, සුදුරෙදි ඇන්දට ඕකා හොරා කියල. එතකොට තව කවුදෝ කිව්වා, සුදුරෙදි හොරා කියල. ගහ උඩ හිටිපු මට ඒක ඇහෙනකොට මහා ලැජ්ජාවක් ආව. සුදු කියන්නෙ පාටක්. සුදු අඳින හැමෝම හොරුත් නෙමෙයි. ඒත් මේ දේශපාලනේ නිසා සුදු ඇඳුමත් හොර නාමෙන් කිළුටු වෙලා. මම ටක් ගාලා අර ලොක්කා වාහනෙන් ගිය පැත්තට ඉගිල්ලුනා. ඒ ගිය ගමනෙදි තමයි මම දැක්කේ, වැවේ පස් කපන, කැලේ ගස් කපන, ටවුමට කුඩු බෙදන, පාතාලෙට උඩගෙඩි දෙන මෙකී නොකී සෙල්ලං සිද්ද වෙන්නෙ මිනිහ දැනුවත්ව කියල.

අන්න ඒ කලකිරීම නිසා තමයි මම මේ නම වෙනස් කරගන්න යන්නෙ. මම කාලයක් තිස්සෙ ලෝයර් මහත්තුරු ඉන්න තැන්වලට කිට්ටු ගස්වල වහලා මගේ ප්‍රශ්නෙ කියනව. ඒත් මනුස්ස භාෂාවයි කුරුළු භාෂාවයි එකිනෙකට වෙනස් දෙකක් නිසාද කොහෙද මම කියන එක එයාලට තේරෙන්නෙ නෑ. ඒත් මම මගේ උත්සාහය අතහරින්නෙ නැහැ. කමක් නෑ. මගේ නම වෙනස් කරගන්න ප්‍රශ්නෙ ගැන ඕගොල්ලො වැඩිය හිතන්න එපා. ඕගොල්ලන්ට කොච්චර ප්‍රශ්න තියෙනවද මේ කාලේ. ඒ නිසා මගේ ප්‍රශ්නේ ගැන හිතන්නෙ නැතුව මේ පාර ඡන්දෙන්වත් ඔයාලගේ ඊළඟ පරම්පරාව ගැන හිතන්න. ඡන්දේ ඉල්ලගෙන එන සුදු රෙදි හොරුන්ට රැවටෙන්නෙ නැතුව, නිවැරදි දිශාව පෙන්වන මාලිමාව දිහාට හැරෙන්න.

**- සුදුරෙදි හොරා**

# ආණ්ඩුවේ රිපෝට් එක මෙන්න!

ලක්ෂ 69 ක ජනතාවකගේ පූර්ණ සහයෝගයෙන් එය සිදු විය. එනම් බහුතර කැමැත්ත දිනුම් ය. බහුතරයේ විශ්වාසය දිනාගනිමින් පිහිටවූ තමන්ගේ ආණ්ඩුව, ඒ බහුතරයේ අපේක්ෂා වෙනුවෙන් පෙනී සිටිනු ඇතැයි ඔවුහු සිතූහ.

## අප්‍රේල් 21 ප්‍රහාරය

අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් පුළුල් සහ විධිමත් පරීක්ෂණයක් සිදු කොට, ඊට අදාළ ව වගකීම් මගහරින ලද සියල්ලන්ට දඬුවම් දෙන බවට පූර්ව මැතිවරණ සමයේදී පොරොන්දුවක් ලැබිණි. ඒ වෙනුවට සිදු වූයේ නීතිපති දෙපාර්තමේන්තුව මගින් ප්‍රහාරය වළක්වා නොගැනීම සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ඉදිරිපත් කළ ඉහළ පොලිස් නිලධාරීන්ට උසස්වීම් පිරිනැමීම ය.

ඊට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කණපිට ගසමින් විමර්ශන අත්දැකීම් නැති නිලධාරීන් එහි විමර්ශන සඳහා යෙදවීය. ඒ පිළිබඳව එම දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් හත් දෙනෙකු විසින් ජාතික පොලිස් කොමිසමට ලිඛිතව දැනුම් දී තිබේ. ප්‍රහාරය වළක්වා නොගැනීම පිළිබද පූර්ණ වගකීම දරන හිටපු ජනාධිපතිවරයාගෙන් ප්‍රකාශයක් හෝ ලබාගැනීමට විමර්ශකයෝ මෙතෙක් සමත් නොවූහ. ඒ වෙනුවට ඔහු මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ආණ්ඩුවේ බහුතරය නියෝජනය කරන පක්ෂයෙන් අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වී සිටී. ආරක්ෂක මණ්ඩලයට තමන් කැදෙව්වේ නැති බවට ප්‍රහාරයෙන් පසු රටට කී, හිටපු අගමැතිවරයාගෙන් මේ පිළිබදව ප්‍රකාශයක් හෝ ලබාගනිතැයි විශ්වාස කරන්නේ කෙසේද ?

## බැඳුම්කර ගනුදෙනුව

පූර්ව ජනාධිපතිවරණ සමයේදී බහුතරය තදින්ම විශ්වාස කළ එක් විමර්ශනයක් විය. ඒ, මහ බැංකු බැදුම්කර වංචාව නමින් ප්‍රසිද්ධ වූ විමර්ශනයයි. එහෙත් බලයට පත්වීමෙන් පසු ආණ්ඩුවේ ඇමතිවරුන් කිව්වේ මෙහි ප්‍රධානතම සැකකරුවෙකු වන මහ බැංකුවේ හිටපු අධිපති, අර්ජුන් මහේන්ද්‍රන් ලංකාවට ගෙන්වීමේ හැකියාවක් නැති බවයි. පූර්ව මැතිවරණ සමයේදී බහුතරයට කිව්වේ පැවති ආණ්ඩුව මහ බැංකු අපරාධයේ සැකකරුවන් ඇල්ලීමට කටයුතු නොකරන බවයි. අර්ජුන් මහේන්ද්‍රන් කෙසේ වෙතත්, රනිල් වික්‍රමසිංහ සහ රවී කරුණානායක පවා පසෙකින් තැබිණි.

## පරණ හොරු

විද්වතුන් ආණ්ඩුවේ පාලනයට හවුල් වී නීතිගරුක, හොරකම් නැති, දූෂණවංචා නැති රටක් බිහි කරන බව බහුතරයේ බලාපොරොත්තුව විය. දැන් ඒ 'විද්වතුන්' නැත. මෙවරත් නාමයෝජනා ලැබී ඇත්තේ පරණ චෝදනා ලත් පිරිසට මය.

**මොන ප්‍රශ්නය තිබුණත් ජාතික ආරක්ෂාව සුරක්ෂිත වනු ඇති බව ඡන්දය දුන් බහුතරය තවදුරටත් විශ්වාස කළේය. ආරුමුගම් තොන්ඩමන් හිටපු ඇමතිවරයාගේ අවමගුලේදී, මැතිවරණ කොමිසමේ සාමාජික රත්නජීවන් හූල්ට එරෙහිව එම කොමිසම ඉදිරිපිට පැවති උද්ඝෝෂණයේදී අදාළ නොවූ නිරෝධායන නීති, ඇමරිකානු තානාපති කාර්යාලය අසළ උද්ඝෝෂණයට අදාළ වූ බවත්, ඊට සහභාගි වූ තරුණියක පොලිස් නිලධාරීන් විසින් උස්සා විසි කරන හැටිත් ඔවුහු දැක්කාහ. ඇස් පිල්ලම් ගසන්නට පෙර මහ පාරේදී පොලුවලින් ගසා ත්‍රීරෝද රථ හිමියන්ගේ ලීසිං ප්‍රශ්න වෙනුවෙන් සටන් කළ සභාපතිවරයා මරා දැමිණි.**

## ගිවිසුම්

පූර්ව ජනාධිපතිවරණ සමයේදී ඉරා දමන බව කී MCC ගිවිසුම දැන් හොඳවී තිබේ. අධිරාජ්‍යවාදී කතා කී පිරිස් නිහඬය. ඒත් බහුතරය මොනවා හෝ කරතැයි තවදුරටත් විශ්වාසයෙන් බලා සිටී.

## ගල්කිස්ස වෙරළ

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් මේ සියල්ල අත් හැරී ගොස් ඇතැයි ලක්ෂ 69 ක බහුතරය විශ්වාස කළේය. එහෙත් ගල්කිස්ස මුහුදු වෙරළ පිරවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය. මාස දෙකකට පසු ඊට වැය කළ ධනස්කන්දය අපතේ යවමින් වැලි සියල්ල මුහුදට ගොස් තිබිණි. 2014 වසරේදී සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය කඩිමුඩියේ සියයට සීයක් අසාර්ථකත්ව අවසන් කෙරිණි. කෙසේ වෙතත් මෙහි කුමක් හෝ විද්‍යාත්මක පදනමක් ඇතැයි බහුතරය තවදුරටත් විශ්වාස කළේය. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ බලාපොරොත්තුවද කඩ කර දැම්මේ ගල්කිස්සේ වැලි, වැල්ලවත්තෙන් මතු වනු ඇතැයි විශ්වාස කළ ද, එසේ නොවූ බව පවසමින් ය.

හෝමාගම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් සෑදීමේ උත්සාහය තවත් උදාහරණයකි. 2008 සිට ක්‍රියාත්මක වූ නාස්තිකාර ජාවාරමක් කරගත් කිරි හරක් ව්‍යාපෘතිය යළි ක්‍රියාවට නැගේ.

## පරිසර විනාශය

මේ අතරවාරයේ වැලි සම්බන්ධයෙන් චක්‍රලේඛ සහ නිවේදන රැසක් නිකුත් කෙරිණි. මුලින්ම වැලි ප්‍රවාහනයට බලපත්‍ර අනවශ්‍ය බව කීවේය. ඉන්පසු බලපත්‍ර අවශ්‍ය වුවද, අදාළ පෝරමයේ ප්‍රවාහනය කරන ස්ථානය, වාහන අංකය ආදිය සදහන් කිරීම අනවශ්‍ය බව කීවේය. ඉන්පසු යළිත් ඒ කිසිත් අනවශ්‍ය බව කීවේය.

## සැමන් හා පරිප්පු

චක්‍රලේඛ එහෙමෙහෙ වූ කොවිඩ්19 වෛරස් වසංගත තත්ත්වය අතරතුර, ජනතාවට සහන සැලසීම සදහා වූ සැමන් සහ පරිප්පු මිල අඩු කිරීමේ තීරණය ද ගැනිණි. සෑම වෙළෙඳසැලකම ඒ මිලට සැමන් පරිප්පු නැතත්, අඩු තරමේ සතොසේ හැමදාම තිබෙනු ඇතැයි බහුතරය විශ්වාස කළේය. එක්වරම ඒ මිල පාලනය සැමන් පරිප්පුවලින් පවා ඉවත් කෙරිණි.

එයින් ඉවත් කළද හාල් අඩුවට ලැබෙනු ඇතැයි ඔවුහු සිතූහ. පාරිභෝගික අධිකාරිය රුපියල් 90ට හාල් විකුණන ලෙස වෙළෙඳුන්ට කියද්දී, මහා පරිමාණ හාල් මෝල් හිමියන් කිව්වේ රුපියල් 98ට මෙහා හාල් කිලෝව විකිණිය නොහැකි බවය. කෙසේ වෙතත් බහුතරය විශ්වාස කළ ගැසට්ටුව වෙනුවට, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය ගැසට්ටුව, ඔවුන් කී මිල ගණන් ආශ්‍රයෙන් සකස් කෙරිණි. වතු සේවකයන්ට දිනකට රුපියල් 1,000.00ක් ගෙවන බවට පොරොන්දු වුවද, දැන් ඒ ගැන කතාවක් නැත.

## නොමිලේ පොහොර

පූර්ව ජනාධිපතිවරණ සමයේදී ගොවි ජනතාව වැඩියෙන් ජීවත් වන ප්‍රදේශවලදී අනිවාර්යයෙන්ම පොහොර ගැන කතා කෙරිණි. බහුතරය හිතුවේ හාල් මිල කෙසේ වෙතත්, වී ටිකක් යහමින් ලැබෙනු ඇතැයි යනුවෙනි. එහෙත් පොහොර සල්ලිවලටවත් දෙන්නැයි ඉල්ලමින් පාරට බසින්නට සිදු වේ යැයි ඔවුන් විශ්වාස කළේ නැත.

## ජාතික ආරක්ෂාව

මොන ප්‍රශ්නය තිබුණත් ජාතික ආරක්ෂාව සුරක්ෂිත වනු ඇති බව ඡන්දය දුන් බහුතරය තවදුරටත් විශ්වාස කළේය. ආරුමුගම් තොන්ඩමන් හිටපු ඇමතිවරයාගේ අවමගුලේදී, මැතිවරණ කොමිසමේ සාමාජික රත්නජීවන් හූල්ට එරෙහිව එම කොමිසම ඉදිරිපිට පැවති උද්ඝෝෂණයේදී අදාළ නොවූ නිරෝධායන නීති, ඇමරිකානු තානාපති කාර්යාලය අසළ උද්ඝෝෂණයට අදාළ වූ බවත්, ඊට සහභාගි වූ තරුණියක පොලිස් නිලධාරීන් විසින් උස්සා විසි කරන හැටිත් ඔවුහු දැක්කාහ. ඇස් පිල්ලම් ගසන්නට පෙර මහ පාරේදී පොලුවලින් ගසා ත්‍රීරෝද රථ හිමියන්ගේ ලීසිං ප්‍රශ්න වෙනුවෙන් සටන් කළ සභාපතිවරයා මරා දැමිණි. තණකොළ පාගන්නේද යන්න බැලීමට පවා ආරක්ෂක අංශ නිලධාරීන් සිටින, රාජ්‍ය ආයතන ගණනාවක සී.සී.ටී.වී. කැමරා පද්ධති සවි කර ඇති කොළඹ, නිදහස් චතුරශ්‍රයේදී රජීව් ජයවීර, වෙඩි තබාගෙන සියදිවි නසාගෙන තිබිණි.

## විශ්වාසය

එහෙත් තවදුරටත් විශ්වාස කරන්නට ඔබට අයිතියක් ඇත. ඒ ඇගෙන් නොව ඔළුවෙන් ය●

# කොරෝනා අහසේ පෑයූ රතු තරුව

'රතු තරුව' කියන්නේ අහම්බ ව්‍යාපෘතියක් නෙමෙයි. ඒකට ඉතිහාසයක් තියෙනවා. '70 අග සුළි සුළංවලින් පීඩාවට පත් වුණු මිනිස්සුන්ට සහය දෙන්න නැගෙනහිරෙන් පායපු 'රතු තරුව' එදායින් පස්සේ විපත් ඇතිවුණු හැමතැනකම අත් හැර දැමූ හැම මිනිසෙක් වෙනුවෙන්ම පායනවා.

නායයෑම්, සුනාමි, ගංවතුර, සුළි සුළං... ආදී ආපදාවලදී කොන්දේසි විරහිතව පායපු 'රතු තරුව' මේ කොරෝනා සමයේ තරම් අවධානයට ලක් වුණේ නැති තරම්. ඒකට එක හේතුවක් තමයි අන් කවරදාකටත් වඩා වැඩියෙන් පොදු ජනයා අත සමාජ මාධ්‍ය භාවිතාවීම. ඒ නිසා මේ පසුගිය ආසන්නම දවස්වල 'රතු තරුව' කළ පැතිරුණු වැඩ කොටස පාට, පක්ෂ, පළාත්, ජාති, ආගම් භේදයක් නැතුවම දිදුලන්න ගත්තා. අගය කරන්න වුණා. කොරෝනා කියන්නේ තවමත් නිසි ප්‍රතිකාර ඖෂධයක් සොයා නොගත් ලෝක ව්‍යාප්ත වෛරස් රෝගයක් බව හැමෝම දන්නවා. ඒත් තමන්ගේ ජීවිත අවධානම ගැන පවා නොසිතා 'රතු තරුව' තමන්ගේ පුරුදු සේවය ඉටු කළා.

'රතු තරුව' රට පුරා රෝහල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, බස් නැවතුම්පළවල්, දුම්රිය ස්ථාන, පොලිස් ස්ථාන.....ආදී බොහෝ ස්ථාන සෞඛ්‍ය සම්පන්න ස්ථාන බවට පත්කළා. ස්වසන රෝගයක් වූ කොරෝනා වෛරසයෙන් ආරක්ෂාවට අවශ්‍ය මාස්ක් තමන්ගේ අත්වලින්ම මහලා රටපුරා බෙදාහැරියා. සමහර රෝහල්වල හිඟව තිබූ සෞඛ්‍ය උපකරණ විතරක් නෙමෙයි ඖෂධ පවා ලබා දුන්නා. සමහර රෝහල්වල හිඟයක් වූ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම අලුතින් හදලා දුන්නා. 'රතු තරුව' මේ හැම දෙයක්ම කළේ අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ විධිමත් ඉල්ලීම්වලට අනුවයි. ඒ කියන්නේ මේ කොරෝනා වසංගත සමයේ 'රතු තරුව' හැම දෙයක්ම කළේත්, කරන්නේත් එහෙම දේ කිසිවෙකුත් නොකළ තැන්වලටයි. ඒ වගේම මේ හැම දෙයක්ම කළේ ස්වෙච්ඡාවෙන්. සම්පූර්ණ සෞඛ්‍ය ප්‍රමිතීන්ට යටත්වයි.

මේ හැම තැනකදීම ඒ ඒ ආයතනවල ආයතන ප්‍රධානීන් 'රතු තරුව'ට කිව්වේ එකම දෙයයි. "බොහෝම ස්තුතියි සහෝදරයා. අපි පඩි ගන්න රජයේ සේවකයෝ තමයි. ඒත් රජයේ ආයතන කරන්න ඕන දෙයක් ඔයාලාගෙන් කරගන්න වුණාට අපිට සමාවෙන්න. ඔයාලා මේ දේවල් නොකළනම් මේ දේවල් කවදාවත් කරගන්න අපිට බැරි වෙනවා." ඒ තමයි, කවුරුන් හෝ කරනකම් බලා නොඉන්න දිරිය මිනිස් පවුලක් විදිහට 'රතු තරුව' ලද සම්මාන ය●



# වගකීම ඉහළින්ම ඉටුකළ වගයි

ජාතික ජන බලවේගය වර්තමානයේ නියෝජනය කරන පක්ෂ හා සංධානවලින් පසුගිය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීධූර 06ක් හිමි ව තිබුණේ ජනතා විමුක්ති පෙරමුණටය. අනිකුත් සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන් 225 අතර කැපීපෙනෙන ජනතා මැදිහත්වීමක් සිදුකළේ එම මන්ත්‍රීවරුන් පිරිසය. පසුගිය පාර්ලිමේන්තුවේ ගෙවුනු අවුරුදු 05 ක කාලය තුළ එක් එක් මන්ත්‍රීවරු පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ හා පහත සඳහන් පාර්ලිමේන්තු ක්‍රමවේද ඔස්සේ සිදුකර ඇති මැදිහත්වීම් අනුව 'වෙරිටේ රිසර්ච්' හා 'Manthri.lk' නම් ස්වාධීන සමීක්ෂණ ආයතන සිදුකරන ලද ශ්‍රේණිගත කිරීම්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.



### අනුර කුමාර දිසානායක

ශ්‍රේණිගත කිරීම **01**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **827**
සංවාද මාතෘකා- **14**



### බිමල් රත්නායක

ශ්‍රේණිගත කිරීම **02**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **748**
සංවාද මාතෘකා- **15**



### නලින්ද ජයතිස්ස

ශ්‍රේණිගත කිරීම **03**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **726**
සංවාද මාතෘකා- **14**



### සුනිල් හඳුන්නෙත්ති

ශ්‍රේණිගත කිරීම **05**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **479**
සංවාද මාතෘකා- **15**



### විජිත හේරත්

ශ්‍රේණිගත කිරීම **19**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **187**
සංවාද මාතෘකා- **14**



### නිහාල් ගලප්පත්ති

ශ්‍රේණිගත කිරීම **22**

**පාර්ලිමේන්තු දායකත්වය**
වාර- **324**
සංවාද මාතෘකා- **14**

### මැදිහත්වීම් සිදුකළ ක්ෂේත්‍ර

- කෘෂිකර්ම
- පරිසර
- සමාජ සුභසාධන
- නීතිය හා සාමය
- මුදල් හා රාජ්‍ය පරිපාලන
- අධ්‍යාපන
- විදේශ රැකියා
- කම්කරු සබඳතා
- සෞඛ්‍ය

### ඉදිරිපත් කළ ආකාරය

- පුද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කිරීම
- අගමැතිවරයාගෙන් ප්‍රශ්න කිරීම
- පාර්ලිමේන්තු විවාදවලට සම්බන්ධ වීම
- මහජන පෙත්සම් ඉදිරිපත් කිරීම
- ලිඛිත ප්‍රශ්න ඉදිරිපත් කිරීම

### වෙනත් පක්ෂවල මන්ත්‍රීවරු කිහිපදෙනෙකුගේ ශ්‍රේණි

රනිල් වික්‍රමසිංහ **20**
රාජිත සේනාරත්න **25**
උදය ගම්මන්පිල **31**
රවුෆ් හකීම් **32**
විමල් වීරවංශ **37**
පාඨලී චම්පික රණවක **39**
එම්.ඒ. සුමන්තිරන් **41**
ආර්. සම්බන්ධන් **42**
සජිත් ප්‍රේමදාස **72**
අතුරලියේ රතන හිමි **96**
මහින්ද රාජපක්ෂ **146**
නාමල් රාජපක්ෂ **151**

# අනුර කතා කරයි



## රට වෙනුවෙන් නව ගමනක් යාමට අපි ආරාධනා කරනවා

ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර කුමාර දිසානායක**

ජනාධිපතිවරයා මාර්තු 02වැනි දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව මහ මැතිවරණය අප්‍රේල් 25වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ බව ඔබ දන්නවා. නමුත් මැතිවරණ කොමිෂන් සභාව කොවිඩ් 19 වසංගතය නිසා ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් මැතිවරණය කල් තැබීමට පියවර ගත්තා. ඒ අනුව මහ මැතිවරණය අගෝස්තු 05 වැනිදා පැවැත්වීමට දින නියම වී තිබෙනවා.

මේ වන විට ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව ඔබේ අපේක්ෂාවන් විශාල ලෙස බිඳ දමා ඇති බව අමුතුවෙන් කිවයුතු නැහැ. ආයතනවල ප්‍රධානීන් ලෙස දූෂිතයන් වෙනුවට විද්වතුන්, ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති අය පත්කරනු ඇතැයි ඔබ සිතා සිටියා. එහෙත් ඒ සඳහා පත් කරනු ලැබ ඇත්තේ පැරණි චෝදනා ලැබූවන්මයි. එසේම ඔහුගේ මැතිවරණ වේදිකාවලදී විශාල ආර්ථික සහන ලබා දෙන බව ප්‍රකාශ වුණා. නමුත් ඔබට එම සහන නොලැබුණා පමණක් නොව නව බදු පැනවීම් මගින් භාණ්ඩවල මිල විශාල ලෙස ඉහළ ගොස් තිබෙනවා. අද ඇත්තටම කුස්සියේ රාක්කයේ තිබෙන්නේ බඩු නෙමෙයි, බදු. ඇත්තටම මේ ආර්ථික සහන කප්පාදුව ඇරඹුණේ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා නෙමෙයි. ඊට පෙරම ජනවාරි මාසයේම ආණ්ඩුව රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් වැඩිවීම, වැටුප් වැඩිකිරීම හා දීමනා නතර කෙරුවා.

ජනාධිපතිවරයා, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ සිටි පැරණි අය වෙනුවට නව පිරිසක් මැතිවරණයට ඉදිරිපත් කරනු ඇතැයි ඇතැමුන් අපේක්ෂා කළා. තමන් පැරදුණේ දූෂිත ඇමතිවරුන් නිසා කියලා මහින්ද රාජපක්ෂ අගමැතිවරයාම වරක් ප්‍රකාශ කර තිබුණා. නමුත් ඒ සියලු දෙනාම මෙවරත් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී සිටිනවා. එසේම සමහරු පරිසරය ගැන සැලකිලිමත් වුණා. ගල්කිස්ස වෙරළ සිදුවීම, විල්පත්තු නව ගැසට්පත් නිකුත් කිරීම, එහි රක්ෂිත ප්‍රදේශවල කෝමාරිකා වැවීමට ඉඩදීම, අලි මංකඩවල් වසා දමමින් අඹ වැවීමට යාම, වැලි හා පස් ජාවාරමට ඉඩදීම ආදී පරිසර විරෝධී ක්‍රියාමාර්ග හේතුවෙන් ඔවුන්ද කලකිරී සිටිනවා.

එසේම තවත් කණ්ඩායමක් ජනතාවගේ බලාපොරොත්තු කඩ කළා. පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව එක්සත් ජාතික පක්ෂයේ ගම් මට්ටමේ ඇතැමෙකුට රැකියා අහිමි වුණා. තවත් අය විවිධ පීඩාවන්ට ලක්වුණා. නමුත් එජාප නායකත්වය තමන්ගේ පාක්ෂිකයන්ගේ ගැටලුවලට මැදිහත් වුණේ නැහැ. ඔවුන්ට ප්‍රධාන වුණේ නායකත්ව ගැටුමයි. සිරිකොත අල්ලා ගැනීම, වෘත්තීය සමිතියේ බලය අල්ලා ගැනීම ආදිය ඔවුන්ට ප්‍රමුඛ වුණා. අවම වශයෙන් තමන් වෙනුවෙන් වැඩ කිරීම නිසා පීඩාවට පත්වූවන් වෙනුවෙන් මැදිහත් වෙන්න ඔවුන් අසමත් වුණා. දැන් ආණ්ඩුව 2/3 ගැන කතාවක් නැහැ. 2010 දී වත් ආණ්ඩුවට 2/3ක් ගන්න බැරිවුණා. එවර එය ලබා ගත්තේ එජාපයේ 20ක් පමණ වරප්‍රසාද දී ආණ්ඩුවට අරගෙනයි. මෙවරත් ආණ්ඩුව උත්සාහ කරන්නේ එම කණ්ඩායම්වලින් පිරිසක් එකතුකර ගැනීමටයි. ඒ නිසා වරප්‍රසාද වෙනුවෙන්, මුදල් වෙනුවෙන් ප්‍රතිපත්ති මාරු කරන පිරිස් පාර්ලිමේන්තුවට යැවීමෙන් තේරුමක් නැහැ.

ජාතික ජන බලවේගය ඔබේ හඬ පාර්ලිමේන්තුව තුළ සැබෑ ලෙසම නියෝජනය කිරීමට සූදානම්. අපි රට පුරාම ශක්තිමත්, ප්‍රතිපත්තිගරුක කණ්ඩායමක් ඉදිරිපත් කර තිබෙනවා. රට ගොඩ නැගීම සඳහා දියුණු ජාතික වැඩපිළිවෙළක් අප සතුයි. දැනට ඔබ අතර ඇත්තේ පවතින පාර්ලිමේන්තුව යනු මිරිස් කුඩු ගහන, වතුර බෝතල් හලන, පිහි රැගෙන එන, අසභ්‍ය වචන කියන අශිෂ්ට තැනක් බවට වන අදහසකුයි. අපි ඒ වෙනුවට පාර්ලිමේන්තුවට ශිෂ්ටත්වය රැගෙන එන කණ්ඩායමක් ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තුවේ ජනතා විමුක්ති පෙරමුණේ අප මන්ත්‍රීවරුන් හයදෙනාගේ හැසිරීම පිළිබඳව කිසිවෙකුටවත් විවේචනයක් නැහැ. එසේම පාර්ලිමේන්තුව අපරාධකරුවන්, මත්පැන් නිෂ්පාදකයන්, ප්‍රධාන සහල් ජාවාරම්කාරයන්, ප්‍රධාන වැලි පස් කපන්නන්, බාර් අයිතිකරුවන්ගෙන් පිරී තිබුණා. එය ශුද්ධ කළ යුතුව තිබෙනවා. අපි ශිෂ්ටසම්පන්න හොඳ මිනිසුන් ජාතික ජන බලවේගය ලෙස මැතිවරණයට ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුව ඔවුන්ගෙන් පිරවීමට ඔබට අවස්ථාව ලැබී තිබෙනවා.

ගවගාලක් ලෙස ඔබගේ හෙළාදැකීමට ලක්වූ පාර්ලිමේන්තුව ශුද්ධ කළ හැක්කේ ඔබටම පමණයි. ගෝඨාභය ජනාධිපතිවරයා බලයට පත්කිරීමට සහය දී බලාපොරොත්තු බිඳවැටුණු ඔබටත් එජාපයට ඡන්දය දී බලාපොරොත්තු බිඳවැටුණු ඔබටත් තෝරාගැනීමට ඇත්තේ ජාතික ජන බලවේගය පමණයි. රට ගොඩනැගීම සඳහා අවංක වුවමනාවක් ඇති සිංහල, දෙමළ, මුස්ලිම් ඔබ සියලුදෙනාට ජාතික ජන බලවේගය සමග රට වෙනුවෙන් නව ගමනක් යාමට අපි ආරාධනා කරනවා●

- **සබුද්ධික දේශයක්**

පවතින අසමාන, යල්පැනගිය, තරගකාරී හා වාණිජකරණය කර ඇති අධ්‍යාපන දේහය සපුරා වෙනස් කොට පුළුල්ව පැතිරුණු ගුණාත්මක අධ්‍යාපන පද්ධතියක් ස්ථාපිත කෙරේ. ඒ සියල්ල ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් බිහිකිරීම අරමුණු කොට ගනී.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය සෑම ක්ෂේත්‍රයකටම ආදේශ කෙරේ. විද්‍යාව, තාක්ෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ජන ජීවිතයේ කාර්යක්ෂමතාවය මෙන්ම නිෂ්පාදනයන්හි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා උපරිම ලෙස යොදා ගැනේ.

- **සංතෘප්තිමත් දේශයක්**

නීරෝගී මානව සම්පතක් අරමුණු කරගත් බලගැන්වුණු සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා සමාන ප්‍රවේශයන් සහිතව, ගුණාත්මක භාවයෙන් සහ උපරිම කාර්යක්ෂමතාවයෙන් යුත් පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ස්ථාපිත කෙරේ.

මනා භූමි කළමනාකරණයෙන් යුත් නිවාස වැඩපිළිවෙළක් හරහා සෑම පවුලකටම පිරිසිදු ජලය, විදුලිය, වාතාශ්‍රය, සනීපාරක්ෂක පහසුකම් සහ නිසි ප්‍රවේශ මාර්ග සහිත ස්ථිර නිවාසයක ජීවත්වීමේ අයිතිය තහවුරු කෙරේ.

අනිසි දේශපාලන මැදිහත්වීම් ඉවත් කොට තිරසාර විද්‍යාත්මක ප්‍රතිපත්ති රාමුවක් ඔස්සේ ක්‍රීඩා ක්ෂේත්‍රය ගොඩනංවනු ලැබේ.

බහුභාෂී සහෘද, වැඩබිමක්, නව සංස්කෘතික මිනිසෙක් බිහිකිරීම අරමුණු කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයන්ගේ අභිවෘද්ධිය සඳහා පුළුල් වැඩපිළිවෙළක් සහතික කෙරේ.

භූමි පරිහරණය, ජලයේ සුරක්ෂිතතාවය, ජෛව විවිධත්වයේ ආරක්ෂාව, වාතයේ, වෙරළේ හා සයුරේ පවිත්‍රතාවය සුරැකීමට පියවර ගැනේ.

- **සශ්‍රීක දේශයක්**

ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, නව තාක්ෂණය හා නව දැනුම පදනම් වූ ගුණාත්මක ජීවිතයක් හා නොසැලෙන ආර්ථිකයක් අරමුණු කොටගත් පුළුල් වැඩපිළිවෙළක් ස්ථාපිත කෙරේ. එහිදී ආර්ථික වෘද්ධිය හා ස්ථායිකරණය, රාජ්‍ය ව්‍යවසාය, දුප්පත්කම තුරන් කිරීම, ඩිජිටල් තාක්ෂණය භාවිතය, දේශීය වෙළඳාම සහ සේවා, විදේශ වෙළඳාම, ආයෝජන හා ව්‍යාපාර, රාජ්‍ය මූල්‍ය හා බදු, රාජ්‍ය ණය, ඉදිකිරීම් ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය ආදී අදාළ සෑම ක්ෂේත්‍රයකම නව වැඩසටහන් ආදේශ කෙරේ.

කාර්යක්ෂම හා ඵලදායි කෘෂිකාර්මාන්තයක් සඳහා පස් අවුරුදු සංයුක්ත සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ. පශු සම්පත් සංවර්ධනය සඳහාද පුළුල් වැඩසටහනක් ක්‍රියාවට නැගේ.

නොසලකා හැර තිබෙන ධීවර හා ජලජ සම්පත් කර්මාන්තය ආර්ථිකයේ වැදගත් පාර්ශ්වයක් ලෙස හඳුනාගෙන පුළුල් වැඩපිළිවෙළක් මගින් සංවර්ධනය කෙරේ.

අර්බුදයක් බවට පත්ව තිබෙන බලශක්ති ක්ෂේත්‍රය නගාසිටුවීමේ කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබේ.

පරිසර හිතකාමී, කාර්යක්ෂම හා ජනතාවාදී ප්‍රවාහන ප්‍රතිපත්තියක් හරහා ප්‍රවාහන අර්බුදය විසඳීමේ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැගේ.

# 'නස්පැත්තිය' වෙනුවට 'ප්‍රතිපත්තිය'

- **සුරක්ෂිත දේශයක්**

ගැඹුරු අසමානතා සහිත පවතින සමාජ තත්ත්වය ප්‍රතික්ෂේප කරමින් සියල්ලන්ටම නිදහස සහ සමානාත්මතාවය තහවුරු වූ හිංසනයෙන් හා පීඩාවන්ගෙන් තොරව ජීවත් විය හැකි සමාජයක් ඇති කිරීම සඳහා ස්ත්‍රී සහභාගීත්වය තහවුරු කිරීමට කටයුතු කෙරේ.

දේශයේ අනාගතය ලෙස සලකා ළමා පරපුර වෙනස්කම් හා පීඩාවන්ගෙන් මුදවා, අයිතීන් තහවුරු කොට සුරක්ෂිත කෙරේ.

බලාපොරොත්තු සුන් කොට සමාජ දේශපාලන ක්‍රියාවලියෙන් තරුණ පරපුර බැහැර කිරීමේ ගතානුගතික ප්‍රවේශයන්ගෙන් මිදී සමාජ ඒකාබද්ධතාවය හා සංවර්ධනය සඳහා වන ව්‍යුහාත්මක ප්‍රවේශයන් ශක්තිමත් කිරීමට ඔවුන්ගේ ඵලදායී දායකත්වය ලබා ගැනීම සඳහා පියවර ගැනේ.

ශ්‍රමයට නිසි ගෞරවය හා පිළිගැනීම ලැබෙන ලෙස සියලුම ශ්‍රේණීන්ගේ ශ්‍රමිකයන්ට සමානාත්මතා මූලධර්මය යටතේ සැලකීමට හැකිවන ආකාරයේ ප්‍රතිමාන ව්‍යුහයක් නිර්මාණය කර සේව්‍යයා හා සේවකයාද, රජය හා ශ්‍රම බලකායද, සමාජය හා ශ්‍රමිකයා අතරද වන සම්බන්ධතා ජාලය මානුෂීයකරණය කිරීමට පියවර ගැනේ.

වැඩිහිටියන්ද, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ද, සමරිසි ප්‍රජාවේ ද අයිතිවාසිකම් සුරක්ෂිත කෙරේ.

- **සදාහරිත දේශයක්**

සැලසුම් නොමැතිකමත් කොල්ලකාරීත්වයත් හමුවේ මහත් පරිසර ව්‍යසනයකට මුහුණපා සිටින අප රටට ජාතික පාරිසරික ප්‍රතිපත්තියක් හරහා සැලසුම්සහගත

- **නීතිගරුක දේශයක්**

ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය, ජනතා අයිතිවාසිකම් තහවුරු කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියලු පාර්ශ්වයන්ගේ දායකත්වයෙන් සකස් කිරීමට පියවර ගැනේ. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට පියවර ගැනේ. අල්ලස් හා දූෂණ තුරන් කිරීමට පියවර ගන්නා අතර මත්ද්‍රව්‍ය නිවාරණයට වැඩපිළිවෙළක් දියත් කෙරේ.

- **ආරක්ෂිත දේශයක්**

නොබැඳිභාවයෙන්ද, අධීනත්වයෙන්ද, ජාත්‍යන්තර සාමය සහජීවනය හා යුක්තිය ආරක්ෂා කරමින්ද අපගේ රටේ ශක්‍යතා ඔප් නංවන විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවනු ලැබේ.


බාහිර යුදමය හා අනෙකුත් උපාය මාර්ගික මැදිහත්වීම්වලට එරෙහිව පියවර ගනිමින් රටේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීමටත්, අභ්‍යන්තර ගැටුම්වලට ඉඩ නොතබමින් මහජන ආරක්ෂාව තහවුරු කිරීමටත් පියවර ගනු ලැබේ.

ජනමාධ්‍ය නිදහස හා තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිය සහතික කෙරේ.

- **එක රටක්**

සියලු ජාතිකත්වයන්ගේ සමාජ, සංස්කෘතික, ආගමික, ආර්ථික, භාෂාමය, දේශපාලනික විවිධත්වයන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිගනිමින් හා ඒවාට ගරු කරමින් ජීවත්වන ජන සමාජයක් ඇති කිරීම තහවුරු කෙරේ. විවිධත්වයෙන් හා සමානාත්මතාවයෙන් බැඳුනු ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැගීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග මාලාවක් ගනු ලැබේ.

# මගේ ඡන්දය මාලිමාවට...



පසුගිය මැතිවරණ කීපයේම මම මගේ ඡන්දය දුන්නේ ජවිපෙට. එදා ඉඳන් මම මගේ ඒ ඡන්දය ගැන සෑහීමකට පත්වුණා. ඒකට හේතුවක් තියෙනවා.

මගේ ඡන්දයෙන් පාර්ලිමේන්තු ගිය ජවිපෙ මන්ත්‍රීවරු, ජවිපෙ සාමාජිකයන්ව හිටපු කිසිම දවසක මගේ ඡන්දයට ඇති ගෞරවය කෙලසුවේ නැහැ. ඒක මට මගේ ඡන්දය ගැන සෑහීමකට පත්වෙන්න පුළුවන් කාරණයක්.

අපි අපේ පාර්ලිමේන්තු ඉතිහාසයේ හිටපු මැති ඇමතිවරු ගැන කතා අහලා දැකලා තියෙනවා. 60-70 දශකවල හිටපු ඒ පරපුරෙහි ඇතමෙක් ජීවත් වුණු 'ගෞරවනීය' දේශපාලන විදිහ ගැන දන්නවා.

ඒත් 70 අග පටන් අපේ රටේ දේශපාලනය සහ දේශපාලකයෝ; හොරු, මංකොල්ලකාරයෝ, ඩීල්කාරයෝ, නීතිවිරෝධී ව්‍යාපාර මෙහෙයවන්නෝ, එළිපිට මත්කුඩු විකුණන්නෝ බවට පත් වුණා. ප්‍රතිපත්තියක් නැතිකම තමන්ගේ ප්‍රතිපත්තිය කරගත්තා.

කුඩා පාපැදියකින් ඡන්දය ඉල්ලගෙන ගෙවල්ගානේ ආපු ප්‍රාදේශීය දේශපාලකයෝ පළමු කොන්ත්‍රාත් වටයෙන් පස්සේ ප්‍රකෝටිපතියෝ වුණා.

තමන්ට ඡන්දය දුන් ජනතාව වගේම ඒ ජනතාවගේ සිතුම් පැතුම්, පොදු උවමනාවන් තඹ සතයකට මායිම් නොකරන්න පටන් ගත්තා.

ඒ වර්ගයේ 'ගරු මැති ඇමතිවරු' අතර මට මගේ ඡන්දයෙන් පත්වුණු මන්ත්‍රීවරු ගැන වටිනාකමක්, ගෞරවයක් ඇතිවුණා. මගේ ඡන්දයෙන් පත්වුණේ ඇත්තටම මන්ත්‍රී සහෝදරවරු. ඇමතිකම් දරද්දීත් ඒ සහෝදරවරු අපිත් එක්ක තිබ්බ සහෝදරකම ආරක්ෂා කළා.

ඒ අය ගමන් බිමන් ගියේ සාමාන්‍ය මිනිස්සු වගේ. ජීවත් වුණේ මන්ත්‍රී තනතුරු ලැබෙන්න කලින් ජීවත් වුණු විදිහටමයි.


බොහෝ දවස්වල සාමාන්‍ය මිනිස්සුත් එක්ක පොදු ප්‍රවාහනයේ ඇවිත් පාර්ලිමේන්තු සභාගැබේ ඉඳගත්ත මිනිස්සු හිටියා නම් ඒ මගේ ඡන්දයෙන් පත්වුණු ජවිපෙ මන්ත්‍රී සහෝදරවරු විතරයි.

ඒ අය, ඔළු ගෙඩි ගණනින් ඉහළින් හිටපු පක්ෂවලට හිතන්නවත් බැරි තරමට අභියෝගාත්මකව වැඩකළා. පාර්ලිමේන්තුව ජනතා වේදිකාවක් බවට පත් කළා. හැම ආණ්ඩුවක්ම කළ වංචා දූෂණ මේ තරමටවත් එළිදරව් වුණේ ඒ අයගේ මැදිහත්වීම නිසයි.

පාර්ලිමේන්තුවේ කිසිම විවාදයක්, ජවිපෙ මගහැර යා නොහැකි විවාද බවට පත් කළා. හැම ස්වාධීන සමීක්ෂණ මණ්ඩලයකම ඉහළින්ම සක්‍රිය මන්ත්‍රීවරු බවට පත්වුණේ මගේ ඡන්දයෙන් පත්වුණු ජවිපෙ මන්ත්‍රීවරු වීම මට මගේ ඡන්දය ගැන අභිමානය ඇති කළා.

දැන් ආයෙමත් මගේ ඡන්දය භාවිතා කරන්න අවස්ථාවක් ඇවිත්. මේ ගමන ජවිපෙ තනිව තරග කරනවා වෙනුවට පුළුල් මහජන බලවේගයක් හදලා. ඒ තමයි ජාතික ජන බලවේගය.

ජාත්‍යන්තරව පවා ඇගයීමට ලක්වූ උගත්, බුද්ධිමත් අපේක්ෂයන් ඇතුළත් මේ ජාතික ජන බලවේගය මෑත ඉතිහාසයේ අනෙකුත් දේශපාලන පක්ෂවලට සැබෑ අභියෝගයක්. මෙතරම් ඇගයුමට ලක් වූ මිනිසුන් අතරින් කෙනෙක්ව මගේ නියෝජිතයා ලෙස, පාර්ලිමේන්තු මන්ත්‍රී ලෙස පත් කරගැනීම මගේ ඡන්දයට මගේ ජීවිත කාලයටම ලැබෙන ඉහළම ගෞරවනීය වටිනාකම කියලයි මම හිතන්නේ.




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20 ස්ථානයේ පදිංචි උපුල් රංජන් වන මා විසින් මහරගම, පිළියන්දල පාර, නුගගහ පෙදෙස, 43/20 ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවන ලදී.